# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 58 — 1973 මැයි 04 වැනි සිකුරාද — 1973.05.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවලට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 551 | ආණ්ඩුවේ නොවෙන දැන්වීම ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 554 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | 555 |
| තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |


සැළකිය යුතුයි.—(i) මුද්දර (සංශෝධන) පනත් කෙටුම්පත 1973 අප්‍රේල් 19 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.; (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරණ මුදල් හා ලංකා රජයේ උකස් බැංකු ( සංශෝධන ) පනත 1973 මැයි මස 4 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

**ආයුර්වේද දෙපාර්තමේන්තුව—කිලිටි රෙදි ඇපිල් ලීම සඳහා ටෙන්ඩර්**

1973 ජූනි මස 01 දින සිට 1973 දෙසැම්බර් මස 31 දින දක්වා (එම දෙදින ද ඇතුළුව) වූ කාලය තුළ බොරැල්ලේ ආයුර්වේද රෝහලට අයත් කිලිටි රෙදි ඇපිල් ලීම සඳහා කොළඹ 8, කෝට්ටේ පාරේ, අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 05. 23 දින පෙ. ව .10.00 දක්වා ලාංකිකයින් ගෙන් සිල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ. නියමිත වේලාව ඉකුත් වූ වහාම ටෙන්ඩර් විවෘත කොට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් 2 බැගින්, කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 10ක් ආයුර්වේද කොමසාරිස් නාමට කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට ඒ සඳහා වූ කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ආයුර්වේද කොමසාරිස් කාර්යාලයට පැමිණ පෞද්ගලිකව ටෙන්ඩර් භාරදුනහොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ ටෙන්ඩර් භාරගත් බවට කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත. තම කැමැත්තනම් මෙහි ඉහළ 1 වෙනි ඡේදයේ දැක්වෙන ලිපිනයට තම ටෙන්ඩරය ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට ටෙන්ඩර්කරුවෙකුට පිළිවන. "රෙදි ඇපිල් ලීමේ ටෙන්ඩරය 1973—බොරැල්ලේ ආයුර්වේද රෝහල" යනුවෙන් සිල් තබන ලද ටෙන්ඩර් ඇතුළත් ලිපි කවරයේ උඩ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද ලිපි කවරයේ සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12.00 ට පෙර ටෙන්ඩර් පෝරම ලබාගත යුතුයි. නියමිත පෝරමයේ නොවන කිසිම ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් පියවූ දින සිට මසක් ගතවන තුරු සියළුම ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුයි.

4. ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට කිසියම් ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය වුවහොත් ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු ඉදිරිපත් කොට ඇති ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලැබේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු ඇප වශයෙන් ටෙන්ඩරයේ මුළු වටිනාකමින් 5% ක් තැන්පත් කොට කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම වෙනුවෙන් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුයි. පිළිගත් ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව අත්සන් තැබූ පසු නොපිළිගත් ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ සියළු විස්තර ආයුර්වේද කොමසාරිස් ගෙන් ලබාගත හැකියි.

වී. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973 අප්‍රේල් මස 25 දින දී,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

5–73—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

### සැළකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවලයහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

### පොල් වගා කිරීමේ මණ්ඩලය

පොල් වගා කිරීමේ මණ්ඩලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්,

(1) අම්බලන්ගොඩ
(2) බංගදෙණිය
(3) වාරියපොල
(4) කුලියාපිටිය
(7) වේයන්ගොඩ සහ
(8) මීගමුව

යන ස්ථානයන්හි පිහිටි, පොල් වගා මණ්ඩලයීය පොහොර ගබඩාවල සිට, ඒ ඒ ප්‍රදේශවල, බලපත්‍ර හිමියන් සතු වතුවලට සහ කුඩා ඉඩම් වලට පොහොර ප්‍රවාහණය සඳහා ලොරි හිමි කොන්ත්‍රාත් කරුවන් ගෙන් 1973. 05. 29 දින පෙ. ව. 10.30 දක්වා වෙන වෙනම ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

'රු. 25 ක ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදලක් සහ රු. 2 ක ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් පසුව ටෙන්ඩර් පත්‍ර කොන්දේසි සහ වෙනත් විස්තර පහත සඳහන් අය වෙතින් 1973. 05. 26 දින දවල් 12.00 වන තෙක් ලබා ගත හැකිය.

සාමාන්‍යාධිකාරී,
පොල් වගා කිරීමේ මණ්ඩලය.

1973. 04. 24,
තැ. පෙ. 1388,
1 වන මහල,
ත. බෞ. ස. ගොඩනැගිල්ල, කොළඹ 1.

5-60—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

### පුත්තලම් කච්චේරිය

පුත්තලම් දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973.05.24 වැනි දින දහවල් 12 තෙක්, මුද්‍ර තබන ලද ටෙන්ඩර්, පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ:—

1. පුත්තලම රජයේ නිවාස අළුත් වැඩියා කිරීම.

2. පුත්තලමේ දිසාපති වෙතින් 1973.05.23 වැනි දින පස්වරු 3 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්වල, පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, අදාළ සියළුම විස්තරද ඔහුගෙන් ලබාගත හැක. රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට හා ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර සමිති වැනි අනුමතිය ලත් සමිතිවලටද පමණක් ටෙන්ඩර් කිරීමට අවකාශ ඇත. එක් එක් වැඩට රු. 10 බැගින් වූ ටෙන්ඩර් තැන්පත් මුදලක් වෙනුවෙන් කච්චේරි කුවිතාන්සි ඉදිරිපත් කරන අයට ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති වැනි අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලින් නිදහස් ය.

3. ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ටෙන්ඩර්පත් බහාලන ලියුම් කවරයේ "පුත්තලම රජයේ නිවාස අළුත්වැඩියා කිරීම" යනුවෙන් සඳහන් කර 1973.05.24 දින දහවල් 12 ට ප්‍රථම පුත්තලමේ දිසාපති වෙත ලැබෙන සේ එවිය යුතුය. මෙදින මෙම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. 1973.05.25 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට ඉඩදෙනු ලැබේ. කොන්ත්‍රාත්තුවේ මුදලින් සියයට පහ (5%) ක් වශයෙන් ගණන් බලන ලද මුදලක් තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇප වශයෙන් බැඳ ගිවිසුම අත්සන් කළ යුතුය. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට ඒ බැව් දන්වා දින 10 ක් ඇතුලත එසේ කිරීමට ඔහු ඉදිරිපත් නොවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වන්නේ ය.

5. නිම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) සඳහා පමණක් මුදල් ගෙවා, ඇප මුදල සමග ඉතිරි සියයට ප්‍රමාණය වැඩ අවසන් කර මාස 3 ක් ඉක්ම ගිය පසු ගෙවනු ලැබේ.

බ. සු. විජේවීර,
පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති.

1973.04.19 වැනි දින,
පුත්තලම කච්චේරියේ දී ය.

5-1—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

### නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

ඉවතලන කඩදාසි "බේල්" කිරීම සඳහා මිල ගණන්

පහත සඳහන් මිලදී ගැනීමේ මධ්‍යස්ථානවලදී ඉවතලන කඩදාසි "බේල්" කිරීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

1. නො. 61, ස්ටැප්ෆර්ඩ් මාවත, කිරිලපොන, කොළඹ 6.
2. නො. 387, වෙල්ලේ කුමාර මාවත, කොළඹ 14.
3. නො. 419, ගාලු පාර, රත්මලාන.
4. නො. 147-149, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.

වැඩි විස්තර සඳහා අයදුම් කරන්න.

මිල ගණන් "ඉවතලන කඩදාසි බේල් කිරීම" යනුවෙන් සඳහන් කොට සාමාන්‍යාධිකාරී වෙත 1973.05.15 වෙනි දින පස්වරු 2 ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

ලියා පදිංචි කම්කරු සමුපකාර සමිති වෙත වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

සාමාන්‍යාධිකාරී.

356, යුනියන් පෙදෙස,
කොළඹ-2.
1973.04.11.

5-54—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

### නුගුණුගල් සහ බොලම්සිට් සැපයීම සඳහා ටෙන්ඩරය

1973 මැයි මස 25 වන දින පෙ. ව. 10.00 දක්වා පහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. රු. 100 ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම් කොළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට පළමු වැඩ කරන දින දහවල් 12.00 න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 5ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් කළමනාකාර

ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර, කොළඹ 5.

5-61—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, සේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කොළඹ කොටුවෙහි ලක්සලෙහි කලා හා මූර්ති භවනය අලුත්වැඩියා කිරීම සඳහා 73.5.25 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. රු. 10,000 ක් සහ ඊට වැඩි ගොඩනැගිලි කටයුතු සඳහා නම රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට ටෙන්ඩර් පෝරම් නිකුත් කැරෙනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තුවේ මෙම කාර්යාලයේ හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර ටෙන්ඩර් පෝරම් ලබාගැනීම සඳහා ලියාපදිංචි වීමට එම ලදුපත 73.5.24 දින දවල් 12 ට හෝ ඉන් පෙර ඉදිරිපත් කළ යුතුයි.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව 3/1 (1/44).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
සේමාස් ගොඩනැගිල්ල,
කොළඹ, 1973. 4. 23.

5-79—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

### සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කෑගල්ල කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1973 ජූනි මස 1 වැනි දින සිට 1973 දෙසැම්බර් 31 වන දායින් (දින දෙකම ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කල අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර බාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ද තත් ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, කෑගල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සටහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන්, හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 6 තීරයේ සඳහන් දිනයන් හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලිබලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරී තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

සී. ඩී. හේරත්,
සෞඛ්‍ය සේවා අධිකාරී, කෑගල්ල.

1973 අප්‍රේල් 24 වැනි දින,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය.

### උපලේඛනය

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් තැන්පත් මුදල | 3<br>ඇප මුදල | 4<br>මසකට රෙදි සේදිය යුතු වාර ගණන | 5<br>මසකට සේදිය යුතු කෑලි ගණන (සාමාන්‍ය) | 6<br>ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| කෑගල්ල මූලික රෝහල—ශල්‍යාගාරය ... ... | 25 ... | 100 ... | 10 ... | 5,500 ... | 1973 මැයි මස 24 වැනි දින පෙරවරු 10ට |

5-72—73.05.04 දින අංක 58 දරණ ගැසට් පත්‍රය

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

**උඩ කම්බි මාර්ග සඳහා ගැල්වනයිස් බෝල්ට් ඇණ, මුරිච්චි යනාදි ද්‍රව්‍යයන් සැපයීම**

තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ගැණුම් පත් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් වර්ගයේ උඩ කම්බි මාර්ග සඳහා අවශ්‍ය ගැල්වනයිස් බෝල්ට් ඇණ සහ මුරිච්චි සැපයීම සඳහා ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ.

| | වර්ගය | අවශ්‍ය ප්‍රමාණය | බ්‍රි. ප්‍ර. යොමුව |
|---|---|---|---|
| 1. | ඇල්. 4 ස්පින්ඩල්ස් 8″ × 5/8″ | 12,800 | අංක 2 රූප 24 |
| 2. | ඇල්. 5 ස්පින්ඩල්ස් 9″ × 5/8″ | 4,800 | අංක 1 රූප 23 |
| 3. | ඇල්. 8 ජේ. සිංගල් ස්පින්ඩල්ස් | 2,300 | අංක 11 රූප 26 |
| 4. | ඇල්. 10 ජේ. ඩබල් ස්පින්ඩල්ස් | 1,500 | අංක 12 රූප 27 |
| 5. | ඇල්. 13 "යූ" ස්පින්ඩල්ස් | 2,700 | අංක 21 රූප 31 |
| 6. | ඇල්. 14 "යූ" ස්පින්ඩල්ස් | 1,500 | අංක 21 රූප 32 |

2. උඩ කම්බි වර්ග ද්‍රව්‍යයන් සම්බන්ධ 1949 අංක 16 දරණ බ්‍රිතාන්‍ය ප්‍රමිති වැඩ විස්තරයනට අනුකූලව ඉහත සඳහන් ද්‍රව්‍යයන් නිපදවිය යුතු අතර, ගැල්වනයිස් ආලේපය 1971 බ්‍රිතාන්‍ය ප්‍රමිති වැඩ විස්තර අංක 729 ට අනුකූලව ආලේප කළ යුතුයි.

3. ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී ටෙන්ඩර්කරුවන් විසින් ඒවායේ සැම්පල් ඉදිරිපත් කළ යුතුය. දැනට මෙම දෙපාර්තමේන්තුවේ භාවිතයට ගන්නා ඉහත සඳහන් ද්‍රව්‍ය වල සැම්පල් මරදානේ පිහිටි තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ දී පරීක්ෂා කිරීමට ටෙන්ඩර් කරුවනට පුළුවන.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී එක එක වර්ගයේ 100 ක් සඳහා මිළ ගණන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "බෝල්ට් ඇණ සහ මුරිච්චි සඳහා ටෙන්ඩර්" යනුවෙන් ලියා සීල් තබන ලද රෙජිස්ටර් තැපෑලෙන්, කොළඹ 1, ලෝටස් පාරේ, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ 6 වෙනි මහලේ, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ගැණුම් පත් මණ්ඩලයේ සභාපති වෙත 1973 මැයි මස 29 දින පෙරවරු 10.00 ට පෙර ලැබෙන සේ එවිය යුතුයි. එසේම එම ටෙන්ඩර් ඉහත සඳහන් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ද බහා ලිය හැක.

6. ටෙන්ඩර් එදිනම (1973.05.29) පෙරවරු 10.00 ට යථෝක්ත කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ඉල්ලුම් කරුවනට එම අවස්ථාවේ දී එහි පැමිණ සිටීමට පුළුවන.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර්වල වලංගු කාලය සහ එම ද්‍රව්‍යයන් සැපයීමට ගතවන කාල සීමාව පිළිබඳ විස්තර ද දන්විය යුතුයි.

8. වැඩි විස්තර කාර්යාල වේලාවන්හි ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් විමසා දැන ගැනීමට පුළුවන.

9. මෙහි සඳහන් ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණයන් අවශ්‍ය පරිදි අඩු වැඩි කිරීමේ බලය ඉහත කී ගැණුම් පත් මණ්ඩලයේ සභාපති වෙත පැවරී ඇත්තේය.

ජී. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට් මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

පාලන අංශය,
6 වෙනි මහල,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර
කොළඹ 1.

5–9—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

### අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකලම් පාරේ) පිහිටි ප්‍රවාහණ අංශයේ ඇති පාවිච්චි කළ පහත සඳහන් වර්ගයට අයත් මෝටර් වාහන දෙකක් 1973 මැයි මස 24 වැනි දින උදේ 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | ලියාපදිංචි අංකය | වර්ගය |
|---|---|---|
| 1. | 22 ශ්‍රී 3989 | බෙඩ්ෆඩ් ටොන් 2½ ලොරිය. |
| 2. | 22 ශ්‍රී 3868 | බෙඩ්ෆඩ් ටොන් 2½ ලොරිය. |

(2) ගැණුම්කරුවන් විසින් එම ස්ථානයේදීම මුදල් ගෙවා වාහන ඉවත් කර ගෙන යා යුතුය. වැඩි විස්තර කොළඹ 1, බ්‍රිස්ටල් විදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

සී. සී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973 අප්‍රේල් 25 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් විදියේ,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

5–71—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කල්මුණේ මහේස්ත්‍රාත් උසාවියේ රාජසන්තක වී ඇති බඩු බාහිරාදිය සහ අයිතිකරුවන් විසින් භාර නොගන්නා ලද බඩු බාහිරාදිය ද 1973 මැයි මස 12 වෙනි දින පස්වරු 1 සිට කල්මුණේ මහේස්ත්‍රාත් උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ බඩු ලබා ගන්නා අය එම අවස්ථාවේදී ම නියමිත මුදල් ගෙවා එම අවස්ථාවේදී ම ඒවා එම ස්ථානයෙන් පිටතට ගෙන යා යුතුය.

කේ. සෝමසුන්දරම්,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්,
මඩකලපුව.

1973.04.19 වෙනි දින,
මඩකලපුවේ,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් කාර්යාලයේ දී ය.

5–12—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

---

### සුරාබදු දෙපාර්තමේන්තුව

**හිස් කාඩ්බෝඩ් පෙට්ටි විකිණීම**

එකක් රු. 1 බැගින් ඔනෑම කෙනෙකුට විකිණීම සඳහා හිස් කාඩ් බෝඩ් මූඩි පෙට්ටි 1,500 කට අධික සංඛ්‍යාවක් කළුතර අංක 1 සුරාබදු ගුදමේ ඇත. මෙම හිස් කාඩ් බෝඩ් මූඩි පෙට්ටි මිළදී ගැනීමට කැමති අයවළුන් විසින් මෙම කාර්‍යාලයට මුදල් ගෙවා ඒවා කළුතරින් ලබාගැනීමට හැකිවනසේ ලියමනක් ලබාගත යුතුවේ.

ජේ. බී. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973. 04. 18.

5–40—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### ගාල්ලේ දිසා අධිකරණයේ දීය

ගාල්ලේ කොටුවේ රැම්පාට් වීදියේ අංක 17 දරණ ස්ථානයේ පදිංචිව සිට නැසීගිය දොස්තර ඞී. ජී. ද ඇස්. කුලරත්න මහතාගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති බූදලයේ කාරණාව ගැනයි.

දැනට ගාල්ලේ, කොටුවේ, රැම්පාට් වීදියේ පදිංචි, සුසිලා ජිනාදරී ධම්මිකා කුලරත්න මහත්මිය ........................පෙත්සම්කාරිය.

අංකය : ඊ/9331 සහ

කොළඹ රොස්මිඩ් පෙදෙසේ අංක 6 දරණ ස්ථානයේ පදිංචි අයවලුන් වන (1) නවීන්ද්‍ර ද සිල්වා කුලරත්න, (2) හිමාෂි ද සිල්වා කුලරත්න, (3) සුලාරි ද සිල්වා කුලරත්න, (4) ගාල්ලේ, වක්වැල්ල පාරේ පදිංචි දොස්තර සූරියවංශ මහතා බාරේ අචිනි ද සිල්වා කුලරත්න, (5) දොඩන්දූව, දොඩන්දූගොඩ පදිංචි අයවලුන් වන පියුමිකා මනෝරි ද සිල්වා කුලරත්න, (6) ජේමචන්ද්‍ර හේමපාල මාටින් ද සිල්වා වගඋත්තරකාරයෝ.

ඉහත සඳහන් බූදල් නඩුවෙන් පෙත්සම්කාර මහත්මියගේ නීතිඥ ඊ. එච්. පණ්ඩිතරත්න මහතාගේ අයදුම පරිදි උසාවියෙන් මා වෙත නිකුත් කරන ලද කොමිෂන් බලපත්‍රය පිට පහත සඳහන් චංචල දේපල පෙත්සම්කාර මහත්මිය පදිංචි නිවසේ දී වර්ෂ 1973ක් වූ මැයි මස 19 වැනි සෙනසුරාදා සවස 1 සිට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනයේ සඳහන් චංචල දේපල

ඊ. එල්. 5507 දරණ ඔස්ටින් ප්‍රින්සස් මෝටර් රථය, රෝගීන් පරීක්ෂා කිරීමට ගන්නා යහන් 2 යි, ඉන්ද්‍රෙරේඩ් පහන් 1 යි, ගර්භණී මවුන් පරීක්ෂා කරන ඇඳන් 1 යි, ස්ටෙරිලයිසර් 1 යි, ඇන්ටොඩ්‍රෑම් (ආයුධ තම්බන උඳුන) 1 යි, වේවැල් තොට්ලි 1 යි, ස්පොට් ලෑම්ප් 1 යි, යකඩ ඇඳන් 1 යි, ලී වේදිකා 1 යි, ලියන මේස 1 යි, තුම්පාරුක්ක 1 යි, වීපෝ 1 යි, රෝද මත සවිකළ පුටු 1 යි, සනීප පුටු 7 යි, රේඩියෝ කැබිනට් 1 යි, ඩ්‍රෙසිං ටේබල් 2 යි, එක්ස්රේ යන්ත්‍ර 1 යි, ඇඩින් මැෂින් 2 යි, ශීතකරණ 2 යි.

විකිණීමේ කොන්දේසි සඳහා විස්තර පත්‍රිකාව බලන්න.

ඞී. ඞී. ඩබ්ලිව්. රත්නපාල,
වෙන්දේසිකාර, බ්‍රෝකර්, තක්සේරුකාර සහ
උසාවියේ කොමසාරිස් තැන.

7, පෙරමුණු හරස් වීදිය,
කොටුව, ගාල්ල,
1973.3.30.

5-52—73.05.04 දින අංක 58 දරන ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යෝ එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. ලංකාවියේ අණපනත් යටතේ නීතූත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | | | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | 20 | 0 |
| කනී තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | | | | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| එක් කොටසක් | ... | ... | ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් | | ... | ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | | ... | ... | 43 | 50 | ... | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.

*කනී පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිල රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 | 50 | ... | 0 | 20 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 00 | ... | 0 | 20 |
| (ආ) | (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | ... | 0 | 15 |
| | (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | ... | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ කනී පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. **සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාද | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.18 බදාද | දවල් 12.00 |
| මැයි | ... | 73.05.04 සිකුරාද | ... | 73.04.25 බදාද | දවල් 12.00 |
| | | 73.05.11 සිකුරාද | ... | 73.05.02 බදාද | දවල් 12.00 |
| | | 73.05.18 සිකුරාද | ... | 73.05.09 බදාද | දවල් 12.00 |
| | | 73.05.25 සිකුරාද | ... | 73.05.15 අඟහරුවාද | දවල් 12.00 |
| ජූනි | ... | 73.06.01 සිකුරාද | ... | 73.05.23 බදාද | දවල් 12.00 |
| | | 73.06.08 සිකුරාද | ... | 73.05.30 බදාද | දවල් 12.00 |
| | | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.06 බදාද | දවල් 12.00 |
| | | 73.06.22 සිකුරාද | ... | 73.06.13 බදාද | දවල් 12.00 |
| | | 73.06.29 සිකුරාද | ... | 73.06.20 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.